// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2078/11 - 2018 ජූලි මස 02 වැනි සඳුදා - 2018.07.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට බණ්ඩාරවෙල දියතලාව ඒකාබද්ධ ජලසම්පාදන ක්‍රමයේ පනංගල ජල ටැංකිය හා නිල නිවාස ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 ජූනි මස 06 වැනි දින,
අංක 35,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1379.

### උපලේඛනය

බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුකුදේගම ග්‍රාම නිලධාරි වසමේ, කුරුකුදේගම පනංගල ගමේ අයිසස්ලෙබ් වත්ත කුරුකුදේ කොටස කේෂ්ත්‍ර 4 නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් අක්කර ෑ 01 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ෑ

| | | |
|---|---|---|
| *උතුරට* | ෑ | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | ෑ | අයිසස්ලෙබ් වත්ත සිට ඇටම්පිටිය මාර්ගය දක්වා වතුපාර ; |
| *දකුණට* | ෑ | අයිසස්ලෙබ් වත්ත සිට ඇටම්පිටිය මාර්ගය දක්වා වතුපාර සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තු ඉඩම ; |
| *බටහිරට* | ෑ | එම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* ෑ ප්‍රධාන විධායක නිලධාරි
මල්වත්ත වැලි වැව්ලි සමාගම,
අයිසස්ලෙබ් වත්ත,
බණ්ඩාරවෙල.

07 - 504

1A - G 27980 — 18 (2018/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*